## ජාතික නිෂ්පාදිතය, ආදායම හා වියදම

### සමස්ත උපනතීන්

1983 දී ශ්‍රී ලංකා ආර්ථිකයේ මූර්ත වර්ධනය සියයට 4.9 ක් පමණ විය. 1982 පදනම් වර්ෂය ලෙස ගෙන ජාතික ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය[1] කිරීමේදී ලත් මෙම වර්ධන අනුපාතය, 1970 පදනම් වර්ෂය ලෙස ගෙන ජාතික ආදායම් ඇස්තමේන්තු ගණනය කිරීමේදී ලද වර්ධන අනුපාතයට සමාන වේ. 1982 දී සියයට 5.1 කින් පමණ වැඩි වූ වර්ධන අනුපාතිකය හා සසඳා බලන කල 1983 දී වර්ධන අනුපාතිකය ආන්තික වශයෙන් අඩු වී ඇත. එයට වඩාත්ම හේතු වූයේ වැවිලි කෘෂිකාර්මික අංශයේ (තේ හා පොල්) නිෂ්පාදනය අඩු වීමත්, ජූලි කලබල නිසා නිමැවුම් කර්මාන්ත, වෙළෙඳ හා සේවා අංශයන්හි ඇති වූ පසුබෑමත්ය. අයහපත් කාලගුණ තත්ත්වයන් හා තවත් හේතූන් නිසා පහත වැටුණු පොල් හා තේ නිෂ්පාදනයෙන් ඇති වූ අඩුපාඩුව බොහෝදුරට වී නිෂ්පාදනයේ වැඩි වීම මගින් පිරිමසා ගත හැකි විය. සංචාරක ව්‍යාපාරය මත රඳා පවතින සේවා අංශය හැරුණුවිට අනෙකුත් අංශයන් කෙරෙහි ජූලි කලබල මගින් ඇති වූ බලපෑම කල් පවතින්නක් හෝ කැපී පෙනෙන සුළු හෝ නොවීය.

පවත්නා සාධක වියදම් මිල අනුව 1983 දී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) රුපියල් කෝටි 10,900 ක් ලෙස දක්වේ. පෙර වසර හා සසඳා බලනවිට මෙය සියයට 20.6 ක වැඩි වීමකි. ද. ජා. නි. මූර්ත වර්ධනය හා සැකසූ කල ආරෝපිත ද. ජා. නි. ගැලපුම් 1983 දී සියයට 16 කින් පමණ වැඩි වී ඇත. විශේෂයෙන් තේ ඇතුළුව අනෙකුත් කෘෂිකාර්මික අපනයනයන්හි මිළ වැඩි වීම ගම්‍ය මිළ දර්ශකය ඉහළ අනුපාතයකින් වැඩි වීමට බෙහෙවින් බලපා ඇත.

1983 ජාත්‍යන්තර වෙළෙඳ අනුපාතය ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි හිතකර තත්ත්වයක් පෙන්නුම් කර ඇත. වෙළෙඳ අනුපාතිකයේ බලපෑම් සඳහා ගලපන ලද මූර්ත ජාතික ආදායම පෙර වසර හා සසඳා බලනවිට 1983 දී සියයට 5.7 ක වැඩි වීමක් දක්වයි. තේ අපනයනය මගින් ලද ආදායම් මෙහිලා කැපී පෙනෙයි. නමුත් තේ මිළ ඉහළ යාම නිසා ඇති වූ පූර්ණ වාසිය ශ්‍රී ලංකාවට ලබා ගැනීමට අසීරු වූයේ අයහපත් කාලගුණය හා තේ කර්මාන්තය මුහුණ පෑ ව්‍යුහාත්මක ප්‍රශ්න හේතුකොටගෙන තේ නිෂ්පාදනය වැඩි කිරීමට නොහැකි වූ බැවිනි.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 1983 දී ශ්‍රී ලංකාවේ ජනගහණය සියයට 1.5 කින් පමණ වැඩි වී තිබේ. 1982 දී දශ ලක්ෂ 15.189 ක් වූ මැදි වසර ජනගහණය 1983 දී දශ ලක්ෂ 15.416 ක් විය. පවත්නා මිල අනුව ඒක පුද්ගල ද. ජා. නි. රුපියල් 7,071 ක් (ඇ. එ. ජ. ඩොලර් 301) වශයෙන් ඇස්තමේන්තු කර ඇත. පසුගිය වසර හා සසඳා බලන කල ඒක පුද්ගල මූර්ත ආදායම 1983 දී සියයට 2.5 කින් වැඩි වී ඇත.

1983 දී ද. දේ. නි. මූර්ත වර්ධනය සියයට 4.9 කින් වැඩි වීමට විශාල වශයෙන් බලපෑවේ දේශීය කෘෂිකාර්මික අංශයේ වර්ධනයයි. මෙම වසරේදී එකී අංශය මගින් එකතු කළ වටිනාකමට මූර්ත වශයෙන් දයක වූ ප්‍රමාණය සියයට 9.4 ක් ලෙස දක්වා ඇත. අනෙක් අතට වැවිලි කෘෂිකාර්මික අංශය සමස්තයක් වශයෙන් ගෙන බලනවිට 1983 දී සියයට 4.9 ක පහත වැටීමක් පෙන්වයි. රබර් නිෂ්පාදනයේ වූ වැඩි වීම තේ හා පොල් අනුඅංශයන්හි නිමැවුමේ ඇති වූ පුළුල් අවාසිය මග හරවා ගැනීමට තරම් සෑහෙන්නක් නොවිය. වැවිලි කෘෂිකාර්මික අංශයේ සිදු වූ පහත වැටීම කෘෂි සැකසුම් අංශයේ එකතු කළ වටිනාකම සියයට 4.6 කින් අඩු වීමට බලපා ඇත.

---

1. ප්‍රතිශෝධිත ජාතික ආදායම් ඇස්තමේන්තු සැකසීමේදී භාවිතා කළ ශිල්පීය ක්‍රම පිළිබඳ සටහනක් 23-24 පිටු වල දක්වා ඇත.

7-7

**ආංශික ක්‍රියාකාරිත්වය**

1982–1983 දක්වා කාලය අතර විවිධ අංශයන්හි වර්ධන අනුපාතිකයන් 1.3 සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත. පෙර වසරට වඩා 1983 දී කෘෂිකර්මය දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය යන අංශය සියයට 5.1 කින් වර්ධනය වී ඇත. කෘෂිකාර්මික අංශයේ සිදු වූ මෙම ඉහළ වර්ධන අනුපාතිකය වී නිෂ්පාදනයේ සිදු වූ සියයට 14.7 ක වැඩි වීමේ ප්‍රතිඵලයකි. නියඟින් හානිවූ දිස්ත්‍රික්කයන්හි සිදු වූ වී නිෂ්පාදනයෙහි අඩු වීම සපුරාලමින් මුළු නිෂ්පාදනයෙහි වැඩි වීමක්ද පෙන්වීමට සමහර දිස්ත්‍රික්කවල ඇති වූ වී නිමැවුමේ විශාල වැඩිවීම සමත් විය. පසුගිය තෙවසර තුළ එකම මට්ටමක පැවති රබර් නිෂ්පාදන 1983 දී සියයට 8.2 ක පමණ වැඩි වීමක් පෙන්නුම් කරයි. තේ හා පොල් නිෂ්පාදන 1983 දී තවදුරටත් පහළ වැටුණි. තේ නිෂ්පාදනය සියයට 4.5 කින් අඩු වූ අතර පොල් නිෂ්පාදනය සියයට 8.2 ක විශාල අඩු වීමක් වාර්තා කර ඇත. 1982 දී සියයට 2.9 ක වර්ධනය හා සසඳා බලනවිට ධීවර කර්මාන්ත අංශය 1983 දී සියයට 5.7 කින් වැඩි වී ඇත.

තේ, රබර් හා පොල් වගාවන් සම්බන්ධිත කෘෂි සැකසුම් කර්මාන්ත අංශයේ එකතු කළ වටිනාකම 1983 දී සියයට 4.6 ක අඩු වීමක් දක්වයි. එකී අංශය 1982 දී අඩු වී ඇත්තේ සියයට 5.3 කිනි. 1982 දී සියයට 8.9 ක වර්ධනය හා සසඳා බලනවිට කර්මාන්ත නිෂ්පාදන අංශය 1983 දී වර්ධනය වී ඇත්තේ සියයට 2 කින් පමණි. මෙය රාජ්‍ය අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය සියයට 15 ක අඩු වීමේත්, පුද්ගලික අංශයේ කර්මාන්තවල නිෂ්පාදනය සියයට 26 ක වැඩි වීමේත් ප්‍රතිඵලයකි. 1982 දී සියයට 10.1 ක වර්ධනය හා සංසන්දනය කර බලනවිට කුඩා කර්මාන්ත අංශය 1983 දී වැඩි වී ඇත්තේ සියයට 4.1 කිනි. සමස්තයක් වශයෙන් ගෙන බලනවිට නිමැවුම් කර්මාන්ත අංශය 1983 දී සියයට 0.8 ක වර්ධනයක් දක්වමින් ආන්තික ලෙස වැඩි දියුණු වී තිබේ. 1982 දී එම අංශයේ වර්ධනය සියයට 4.8 ක් පමණ විය.

තැනීම් කටයුතු අංශය සියයට 1.0 ක ආන්තික වර්ධනයක් මෙම වසරේදී දක්වා ඇත. පුද්ගලික අංශයේ ගොඩනැගිලි ඉදි කිරීම් කටයුතු පසුගිය දෙවසරේදී මෙන්ම මෙම වසරේදීද අඩු වීමක් දක්නට තිබේ. කොළඹ මහ නගර සභාව මගින් අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුම් සංඛ්‍යාව සියයට 21 කින් අඩු වී ඇත. කෙසේ වුවද මහවැලි සංවර්ධන වැඩසටහනේ තැනීම් කටයුතු තවදුරටත් විශාල ලෙස සිදු වී ගිය බැවින් පුද්ගලික අංශයේ තැනීම් කටයුතුවල පහත වැටීම මග හැරවීමට එය සමත් විය. මාදුරුඔය යෝජනා ක්‍රමයේ තැනීම් කටයුතුවල පහත වැටීම රන්දෙනිගල ව්‍යාපෘතියේ නව තැනීම් කටයුතු මගින් සමනය කර ගැනීමට හැකි විය.

1983 දී විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවාවන්හි එකතු කළ අගය සියයට 6.6 කින් පමණ වැඩි විය. පෙර වසර හා සසඳා බලනවිට විදුලිබල උත්පාදනය මෙම වසරේදී සියයට 2.3 කින් වැඩි වී ඇත. කෙසේ වුවද ගෑස් නිෂ්පාදන සියයට 20 කින් පමණ ඉහළ ගොස් තිබේ.

පසුගිය වසරේදී සියයට 6.2 ක වර්ධනයක් දැක්වූ ප්‍රවාහනය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරු අංශය 1983 දී සියයට 4.5 ක දියුණුවක් පෙන්වයි. මෙම මඳ වර්ධන අනුපාතය කෙරෙහි මූලිකවම බලපා ඇත්තේ ආනයන අංශයේ සිදු වූ සුළු වර්ධන රටාවයි.

තොග සහ සිල්ලර වෙළෙඳාම් අංශයේ එකතු කළ වටිනාකම 1983 දී සියයට 5.3 කින් වැඩි විය. එය 1982 දී වැඩි වූයේ සියයට 6.0 කිනි. මෙහිදීද ආනයන මත පදනම් වූ වෙළෙඳ අංශය මගින් එකතු කළ අගයට දයක වූ ප්‍රමාණය වැඩි වූයේ සෙමිනි.

1982 දී සියයට 11.9 ක වර්ධනය හා සළකා බලනවිට බැංකු කටයුතු, රක්ෂණය හා නිශ්චල දේපල අංශය 1983 දී සියයට 21.4 ක වර්ධනයක් දක්වයි. නිවාස අයිතිය පිළිබඳ අංශයේ එකතු කළ වටිනාකම සියයට 2.3 කින් වැඩි වී ඇත. 1982 දී එම අංශය වැඩි දියුණු වී ඇත්තේ සියයට 5.5 කිනි.

## 1·7 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1982 — 1983

| අංශය | එකතු කළ වටිනාකම (රුපියල් දශලක්ෂ) | | ද.ජා.නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | පසුගිය වසරට වඩා වැඩිවීම රු. දශ ලක්ෂ | ද.ජා.නි. වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | 1982(අ) | 1983 (අ) | 1982 | 1983 | 1983 | 1983 |
| 1. කෘෂිකර්මය, ද්‍රව ආදී වන ද්‍රව්‍ය .. | 24,964 | 26,237 | 27·7 | 27·9 | 1,273 | 34·7 |
| 1·1 කෘෂිකර්මය .. | 20,771 | 21,810 | 23·0 | 23·2 | 1,039 | 28·3 |
| 1·1·1 තේ .. | 2,418 | 2,309 | 2·7 | 2·5 | – 109 | – 3·0 |
| 1·1·2 රබර් .. | 770 | 833 | 0·9 | 0·9 | 63 | 1·7 |
| 1·1·3 පොල් .. | 3,263 | 2,995 | 3·6 | 3·2 | – 268 | – 7·3 |
| 1·1·4 වී .. | 5,484 | 6,252 | 6·1 | 6·6 | 768 | 20·9 |
| 1·1·5 අනෙකුත් .. | 8,836 | 9,421 | 9·8 | 10·0 | 585 | 15·9 |
| 1·2 ද්‍රව ආදි වන ද්‍රව්‍ය .. | 1,710 | 1,816 | 1·9 | 1·9 | 106 | 2·9 |
| 1·3 ධීවර කර්මාන්තය .. | 2,483 | 2,611 | 2·7 | 2·8 | 128 | 3·5 |
| 2. පතල් හා කැනීම් කටයුතු .. | 2,238 | 2,413 | 2·5 | 2·6 | 175 | 4·8 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 13,601 | 13,710 | 15·1 | 14·6 | 109 | 3·0 |
| 3·1 අපනයන සැකසීම .. | 2,846 | 2,715 | 3·1 | 2·9 | – 131 | – 3·6 |
| 3·2 කර්මාන්ත නිෂ්පාදන .. | 8,777 | 8,953 | 9·7 | 9·5 | 176 | 4·8 |
| 3·3 කුඩා හා අනෙකුත් කර්මාන්ත .. | 1,978 | 2,042 | 2·2 | 2·2 | 64 | 1·8 |
| 4. තැනීම් .. | 7,959 | 8,039 | 8·8 | 8·6 | 80 | 2·2 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා .. | 1,089 | 1,161 | 1·2 | 1·2 | 72 | 2·0 |
| 6. ප්‍රවාහනය හා පණිවුඩ හුවමාරුව .. | 8,536 | 8,920 | 9·4 | 9·5 | 384 | 10·4 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳම .. | 16,059 | 16,910 | 17·8 | 18·0 | 851 | 23·1 |
| 7·1 ආනයන .. | 4,167 | 4,242 | 4·6 | 4·5 | 75 | 2·0 |
| 7·2 අපනයන .. | 2,861 | 2,870 | 3·2 | 3·1 | 9 | 0·2 |
| 7·3 දේශීය .. | 9,031 | 9,798 | 10·0 | 10·4 | 767 | 20·8 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපළ .. | 3,192 | 3,876 | 3·5 | 4·1 | 684 | 18·6 |
| 9. නිවාස අයිතිය .. | 3,250 | 3,315 | 3·6 | 3·5 | 65 | 1·8 |
| 10. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු .. | 2,812 | 3,673 | 3·1 | 3·9 | 861 | 23·4 |
| 11. සේවා (අන්තැනෙක සඳහන් නොවන) .. | 8,698 | 8,672 | 9·6 | 9·2 | – 26 | – 0·7 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය .. | 92,398 | 96,926 | 102·3 | 103·1 | 4,528 | 123·3 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | – 2,034 | – 2,889 | – 2·3 | – 3·1 | – 855 | – 23·3 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය .. | 90,364 | 94,037 | 100·0 | 100·0 | 3,673 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

අ. තාවකාලිකයි.

1983 දී රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු අංශයේ එකතු කළ වටිනාකම විශාල වැඩි වීමක් පෙන්නුම් කරයි. 1982 දී සියයට 7.0 ක වර්ධනයක් පෙන්වූ අනෙකුත් සේවා අංශය 1983 දී ආන්තික අඩු වීමක් දක්වයි. ඊට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ සංචාරක අනු අංශයේ පහත වැටීමයි. පෙර වසරට වඩා 1983 දී පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සියයට 17.2 කින් පහත වැටී ඇත.

අංශීය ක්‍රියාකාරිත්වය ගැන විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ මූර්ත නිෂ්පාදන මට්ටම පැවතිය හැකි ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පවතින බවය. විශේෂයෙන් තේ ඇතුළුව රජය සතු වැවිලි කෘෂිකාර්මික අංශයේ හා රාජ්‍ය සංස්ථාවන්හි සමස්ත නිෂ්පාදනය සියයට 15.0 කින් අඩු වීම තුළින් ඒ බව සනාථ වෙයි. මෙම අංශයන්හි නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව වැඩි කොට එමගින් වඩා ඉහළ මූර්ත වර්ධන අනුපාතයක් ලබා ගත හැකිය.

**වියදම් රටාව**

පවතින මිළ ගණන් අනුව දළ දේශීය වියදම (ද. දේ. වි.) රුපියල් කෝටි 14,080 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. පෙර වසර හා සසඳන කල එය රුපියල් කෝටි 2,200 ක වැඩි වීමකි. පසුගිය වසරට වඩා සියයට 20 ක පමණ වැඩි වීමක් පෙන්නුම් කරන මුළු පරිභෝජන වියදම මෙම වසරේදී රුපියල් කෝටි 10,570 ක් වශයෙන් දක්වේ. ඉන් පුද්ගලික පරිභෝජන වියදම රුපියල් කෝටි 9,550 ක් වන අතර එය පෙර වසරට වඩා සියයට 19.0 ක වැඩි වීමකි. මෙම වසරේදී රජයේ පරිභෝජන වියදම පසුගිය වසර හා සසඳා බලන කල සියයට 23.0 කින් වැඩි වී ඇත.

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය මත සිදු වූ වියදම රුපියල් කෝටි 3,500 ක් ලෙස දක්වේ. එය පෙර වසර හා බලනවිට රුපියල් කෝටි 440 ක හෝ සියයට 15.0 ක වැඩි වීමකි. පුද්ගලික අංශයේ හා රාජ්‍ය සංස්ථාවන්හි ප්‍රාග්ධන සම්පාදනය සියයට 16.0 කින්ද, රජයේ ප්‍රාග්ධන සම්පාදනය සියයට 7.0 කින්ද වැඩි වී ඇත.

**1 . 8 සංඛ්‍යා සටහන**

**තෝරාගත් ආනයනිත ආයෝජන භාණ්ඩ**

(මි. ර. ගැ.වටිනාකම රු.'000)

| | ශීර්ෂය | 1980 | 1981 | 1982 | 1983 |
|---|---|---|---|---|---|
| 1. | බස් සහ මගී ප්‍රවාහන රථ .. | 421,207 | 338,430 | 309,749 | 515,751 |
| 2. | ලොරි සහ වෑන් .. | 765,460 | 771,071 | 658,875 | 824,041 |
| 3. | ඇන්ජිම සවිකරණ ලද වැයි .. | 235,296 | 59,317 | 222,518 | 107,319 |
| 4. | ට්‍රැක්ටර් .. | 370,246 | 116,148 | 86,092 | 212,812 |
| 5. | බුල්ඩෝසර් .. | 512,351 | 350,451 | 362,904 | 394,854 |
| 6. | දුම්රිය ඇන්ජින් සහ අමතර කොටස් .. | 300,043 | 123,124 | 169,589 | 3,925 |
| 7. | ගුවන් යානා සහ හෙලිකොප්ටර් .. | 3,725 | 760 | 2,437,599 | 775,318 |
| 8. | මුහුදු යාත්‍රා ඇන්ජින් සහ පිටතින් සවිකරණ බෝට්ටු ඇන්ජින් .. | 107,334 | 73,952 | 47,987 | 65,286 |
| 9. | නැව්, තෙල් නැව් සහ ට්‍රෝලර් .. | 6,721 | 421 | 999,327 | 826,916 |
| 10. | විදුලි උත්පාදන යන්ත්‍ර .. | 117,457 | 264,984 | 145,220 | 209,589 |
| 11. | ලියවන පට්ටල්, මිලිං පට්ටල්, විදින යන්ත්‍ර ආදිය .. | 91,659 | 38,591 | 35,013 | 34,355 |

මූලය: ශ්‍රී ලංකා රේගුව

1982 දී සියයට 48.0 ක වැඩි වීමක් පෙන්නුම් කල ආනයනිත ප්‍රාග්ධන භාණ්ඩවල මුළු වටිනාකම 1983 දී සියයට 1.2 ක අඩු වීමක් පෙන්නුම් කරයි. තවද 1982 දී සියයට 156 කින් පමණ වැඩි වූ ප්‍රධාන ප්‍රාග්ධන භාණ්ඩයන්හි ආනයන වටිනාකම 1983 දී සියයට 27.5 කින්

පමණ අඩු වී ඇත. නැව්, ගුවන් යානා සහ දුම්රිය ඇන්ජින් වැනි ප්‍රධාන ප්‍රාග්ධන භාණ්ඩයන්හි ආනයනය 1983 දී අඩු වී තිබේ. කෙසේ වුවද, බස්රථ, මගී ප්‍රවාහන රථ, ලොරි, වෑන්, ට්‍රැක්ටර් හා විදුලි උත්පාදන යන්ත්‍ර ආනයනය කිරීම වැඩි වීමක් දක්වයි.

ප්‍රාග්ධන සම්පාදනයෙන් විශාල කොටසක් තැනීම් කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිළදී ගැනීම සඳහා වැය වී ඇත. පවත්නා මිල ගණන් යටතේ ගොඩනැගිලි හා තැනීම් කටයුතුවල ප්‍රාග්ධන සම්පාදනය 1983 දී සියයට 34.0 කින් පමණ වැඩි වී තිබේ. මහවැලි සංවර්ධන වැඩසටහනෙහි තැනීම් කටයුතුවල අගය රුපියල් කෝටි 710 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. පෙර වසර හා සසඳන කල යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා වූ ප්‍රාග්ධන සම්පාදනය සියයට 21.0 කින් පමණ වැඩි වී තිබේ.

වටිනාකම වශයෙන් බලනවිට ඉඩම් සංවර්ධන හා නැවත වගා කිරීම්හි ප්‍රාග්ධන සම්පාදනය සියයට 10 ක වර්ධනයක් දක්වයි. මෙම වැඩි වීමට හේතු වී ඇත්තේ ඉඩම් සංවර්ධනය හා නැවත වගා කිරීම සම්බන්ධයෙන් දැරීමට සිදු වූ වියදම් අධික වීමයි. තේ, රබර්, පොල් සම්බන්ධව නැවත වගා කළ බිම් ප්‍රමාණය අඩු වී ඇත. 1982 දී නැවත වගා කළ තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,004 ක් වූ අතර එය 1983 දී හෙක්ටයාර 1,367 ක් වී ඇත. 1983 දී නැවත වගා කල රබර් හෙක්ටයාර ප්‍රමාණය 5,119 කි. එය පෙර වසරේ නැවත වගා කළ බිම් ප්‍රමාණය හා බලනවිට සියයට 13.0 ක අඩු වීමකි. 1983 වසර තුළදී සංවර්ධනය කරන ලද පොල් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 6,363 කි. මෙය කලින් වසරේදී සංවර්ධනය කරන ලද පොල් ඉඩම් ප්‍රමාණයට වඩා සියයට 32.0 ක අඩු වීමකි.

### 1 . 9 සංඛ්‍යා සටහන

### ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය

(රුපියල් දශ ලක්ෂ)

| ශීර්ෂය | 1980 | 1981 | 1982 | 1983 |
|---|---|---|---|---|
| 1· දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 20,845 | 23,279 | 30,360 | 35,246 |
| 2· ආනයනිත ආයෝජන භාණ්ඩ (මි. ර. ගැ. වටිනාකම) | 7,531 | 7,431 | 11,034 | 10,900 |
| 3· නැව් සහ ගුවන්යානා හැර ආනයනික ආයෝජන භාණ්ඩ (මි. ර. ගැ. වටිනාකම) .. | 7,521 | 7,430 | 7,597 | 9,298 |
| 4· ආනයනිත ප්‍රමාණය (2,1 හි ප්‍රතිශතයක් වශයෙන්) .. | 36·1 | 31·9 | 36·3 | 30·9 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි ඇතුළත් ආනයන ප්‍රමාණය 1982 දී සියයට 30.9 සිට 1983 දී සියයට 36.3 දක්වා අඩු වී ඇත. 1982 දී රුපියල් කෝටි 1,100 ක් වූ ආනයනිත ප්‍රාග්ධන භාණ්ඩයන්හි මි. ර. ගැ. වටිනාකම සියයට 1.0 ක අඩු වීමක් දක්වමින් 1983 දී රුපියල් කෝටි 1,090 ක මට්ටමට ලඟාවී ඇත. කෙසේ වුවද ගුවන් යානා, හෙලිකොප්ටර, නැව් හා ට්‍රෝලර් ආදී ප්‍රාග්ධන භාණ්ඩයන් හැර අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩයන්හි ආනයනය සියයට 22.0 ක වර්ධනයක් පෙන්නුම් කරමින් 1982 දී රුපියල් කෝටි 760 සිට 1983 දී රුපියල් කෝටි 930 දක්වා වැඩි වී තිබේ. කලින් දැක්වූ පරිදි වැඩි වටිනාකමින් යුත් ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය 1983 දී අඩු වී ඇත.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

පවත්නා වෙළෙඳ මිල අනුව බලනවිට 1983 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වූ මුළු සම්පත් ප්‍රමාණයේ වටිනාකම රුපියල් කෝටි 17,260 ක් වශයෙන් ගණනය කර ඇත. ඉන් රුපියල් කෝටි 12,230 ක් වටිනා සම්පත් ප්‍රමාණයක් දේශීය නිෂ්පාදනය තුළින්ද, ඉතිරි රුපියල් කෝටි 5,030 ක් වටිනා සම්පත් ප්‍රමාණය ආනයන වලින් ද ලබාගෙන ඇත. සම්පත් උපයෝජනය ගැන සළකා බැලීමේදී රුපියල් කෝටි 10,570 ක් පරිභෝජනය සඳහා කැපවී ඇත. පෙර වසරේදී එම ප්‍රමාණය රුපියල් කෝටි 8,830 ක් විය. 1982 දී රුපියල් කෝටි 3,040 හා සසඳා

## 1·10 සංඛ්‍යා සටහන

### සම්පත් සංයුතිය සහ උපයෝගී කරගත් ආකාරය 1978—1983

| ශීර්ෂය | පවත්නා වෙළෙඳ මිල අනුව (රු. දශ ලක්ෂ) | | | | 1978 මිල අනුව | | | | | | | | ප්‍රතිශත වර්ධනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1981* | 1982* | 1983* | 1978 | | 1981 | | 1982 | | 1983 | | 1980 ට වඩා 1981 | 1981 ට වඩා 1982 | 1982 ට වඩා 1983 |
| | | | | | වටිනාකම රු. දශලක්ෂ | % | වටිනාකම රු. දශලක්ෂ | % | වටිනාකම රු. දශලක්ෂ | % | වටිනාකම රු. දශලක්ෂ | % | | | |
| 1· මුළු සම්පත් .. | 59,537 | 124,563 | 146,045 | 172,590 | 59,537 | 100 | 75,233 | 100 | 78,328 | 100 | 81,392 | 100 | 5·1 | 4·1 | 3·9 |
| 1·1 වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය .. | 42,665 | 85,005 | 100,140 | 122,322 | 42,665 | 72 | 50,766 | 67 | 53,355 | 68 | 55,969 | 69 | 5·8 | 5·1 | 4·9 |
| 1·2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 16,872 | 39,558 | 45,905 | 50,268 | 16,872 | 28 | 24,467 | 33 | 24,973 | 32 | 25,423 | 31 | 3·6 | 2·1 | 1·8 |
| 2· උපයෝගීකරණය .. | 59,537 | 124,563 | 146,045 | 172,590 | 59,537 | 100 | 75,233 | 100 | 78,328 | 100 | 81,392 | 100 | 5·1 | 4·1 | 3·9 |
| 2·1 පරිභෝජනය .. | 36,148 | 75,061 | 88,289 | 105,724 | 36,148 | 61 | 46,967 | 63 | 48,940 | 63 | 51,885 | 63 | 7·7 | 4·2 | 6·0 |
| 2·2 දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය.. | 8,521 | 23,279 | 30,360 | 35,246 | 8,521 | 14 | 13,045 | 17 | 13,305 | 17 | 13,504 | 17 | 2·6 | 2·0 | 1·5 |
| 2·2·1 රජය .. | (3,077) | (4,126) | (5,125) | (5,632) | (3,077) | (5) | (3,328) | (4) | (3,239) | (4) | (3,158) | (4) | – 12·5 | – 2·7 | —2·5 |
| 2·2·2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල.. | (2,056) | (8,360) } | (25,235) | (29,614) | (2,056) | (3) | (4,551) | (6) } | (10,066) | (13) | (10,346) | (13) | 9·0 | 3·6 | 2·8 |
| 2·2·3 පෞද්ගලික අංශය | (3,388) | (10,793) } | | | (3,388) | (6) | (5,166) | (7) } | | | | | | | |
| 2·3 තොග වෙනස්වීම් .. | 33 | 331 | 248 | – 210 | 33 | — | 103 | — | 73 | — | – 55 | — | — | — | — |
| 2·4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනය .. | 14,835 | 25,892 | 27,148 | 31,830 | 14,835 | 25 | 15,118 | 20 | 16,010 | 20 | 16,058 | 20 | 3·0 | 5·9 | 0·3 |

* තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

බලනවිට මෙම වසරේදී දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වෙනුවෙන් රුපියල් කෝටි 3,520 ක වටිනාකමෙන් යුත් සම්පත් වැයවී ඇත. පසුගිය වසරට වඩා දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 18.0 ක වැඩි වීමක් පිළිබිඹු කරයි.

1978 ස්ථාවර මිල අනුව ගණනය කරන ලද සම්පත්වල මුළු වටිනාකම 1983 දී සියයට 3.9 ක වැඩි වීමක් දක්වයි. 1982 දී සියයට 2.1 කින් වැඩි වූ ආනයනයන් 1983 දී වැඩිවී ඇත්තේ සියයට 1.8 කිනි. මූර්ත වශයෙන් බලන කල සමස්ත පරිභෝජන වියදම් සියයට 6.0 කින්ද, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 1.5 කින්ද, 1983 දී වැඩි වී තිබේ. රාජ්‍ය අංශයේ මූර්ත ප්‍රාග්ධන සම්පාදනය සියයට 2.5 කින් පමණ අඩු වී තිබෙන අතර පුද්ගලික අංශයේ හා රාජ්‍ය සංස්ථාවන්හි ප්‍රාග්ධන සම්පාදනය සියයට 2.8 කින් පමණ වැඩි වී ඇත.

විදේශීය ශුද්ධ සාධක ආදයම හා පුද්ගලික ප්‍රේෂණ ඇතුළත් නොවන දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් කෝටි 1,660 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙය දේශීය ඉතිරි කිරීම්හි සියයට 40 ක පමණ වැඩි වීමක් නියෝජනය කරයි. වෙළෙඳ මිල අනුව වූ දළ දේශීය වියදමෙහි අනුපාතයක් ලෙස බලන කල දේශීය ඉතිරි කිරීම් ප්‍රමාණය 1982 දී සියයට11.8 සිට 1983 දී සියයට 13.6 දක්වා වැඩි දියුණු වී ඇත. විදේශීය ශුද්ධ සාධක ආදයම හා පුද්ගලික සංක්‍රාමද ඇතුළත් වන ජාතික ඉතිරි කිරීම් ප්‍රමාණය රුපියල් කෝටි 1,980 ක් වශයෙන් දැක්වේ. මෙය පෙර වසර හා බලනවිට සියයට 29.0 ක වර්ධනයකි. 1982 දී සියයට 15.3 ක්වූ ජාතික ඉතිරි කිරීම් අනුපාතය 1983 දී සියයට 16.2 දක්වා වැඩි දියුණු වී ඇත.

**1.11 සංඛ්‍යා සටහන**
**ජාතික ඉතුරුම් 1979—1983**
**(පවත්නා වෙළෙඳ මිල අනුව)**

(රු. දශ ලක්ෂ)

| වර්ගය | 1979 | 1980* | 1981* | 1982* | 1983* |
|---|---|---|---|---|---|
| 1· වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය | 52,387 | 66,527 | 85,005 | 100,140 | 122,322 |
| 2· දේශීය ඉතුරුම් .. | 7,218 | 7,443 | 9,944 | 11,851 | 16,598 |
| 3· විදේශීය ශුද්ධ සාධක ආදයම .. | — 240 | — 432 | - 1,712 | - 2,034 | -3,164 |
| 4· විදේශීය ශුද්ධ පුද්ගලික පැවරුම් .. | 754 | 2,260 | 3,918 | 5,494 | 6,401 |
| 5· ජාතික ඉතුරුම් .. | 7,732 | 9,271 | 12,150 | 15,311 | 19,836 |
| 6· දේශීය ඉතුරුම් අනුපාතය (අංක 2, අංක 1 හි ප්‍රතිශතයක් වශයෙන්) .. | 13·8 | 11·2 | 11·7 | 11·8 | 13·6 |
| 7· ජාතික ඉතුරුම් අනුපාතය (අංක 5, අංක 1 හි ප්‍රතිශතයක් වශයෙන්) .. | 14·8 | 14·0 | 14·3 | 15·3 | 16·2 |

* තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**ශිල්පීය ක්‍රම පිළිබඳ සටහන**
**ප්‍රතිශෝධිත ජාතික ආදයම් ඇස්තමේන්තු**

දේශීය හා ජාත්‍යන්තර ආර්ථික වෙනස්කම්වල බලපෑම නිසා ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ඇති වූ ව්‍යුහාත්මක වෙනස්කම් එළදයි ලෙස සළකා බැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1983 වසරේදී ජාතික ආදයම් ගිණුම් ගණනය කිරීම සවිස්තරාත්මකව ප්‍රතිශෝධනය කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කරන ලදී. මෙම අභ්‍යාසයෙහි පළමු අදියරේ ප්‍රතිඵලයන් සම්බන්ධ වන i. කෘෂිකර්මය ii. කෘෂි–සැකසුම් iii. ධීවර කටයුතු, iv. පතල් හා කැනීම් කටයුතු, v. විදුලි බලය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා, vi. නිවාස අයිතිය හා vii. රාජ්‍ය පරිපාලනය යන අංශ මෙම වාර්ෂික වාර්තාව සමග ඉදිරිපත් කෙරේ.

ස්ථාවර වටිනාකම් යටතේ වූ ප්‍රතිශෝධිත ජාතික ආදයම් ගණනය කිරීමේදී 1982 පදනම් වර්ෂය ලෙස භාවිතා කර ඇත. 1982 පදනම් වර්ෂය ලෙස තෝරා ගැනීමට හේතු වූ ප්‍රධාන කරුණු දෙකක් වේ. පළමු කරුණ නම්, 1977 වසරින් පසු ක්‍රියාත්මක කරන ලද නව ආර්ථික

ප්‍රතිපත්ති නිසා ආර්ථිකයේ ඇති වූ ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස්කම් වඩාත් තහවුරු වූයේ 1982 දී පමණ වීමය. දෙවන කරුණ නම් සවිස්තරාත්මකව දත්ත එක් රැස් කිරීමේ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වූයේ 1982 දී හෝ ඒ අතරතුර වීමයි. 1981/82 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාරිභෝගික මුදල් හා සමාජ ආර්ථික සමීක්ෂණය කරන ලදී. එමෙන්ම 1981 දී ජාතික ජන– හා නිවාස සංගණනයක්ද පැවැත්විණි.

ප්‍රතිශෝධනය කරන ලද ප්‍රධාන අංශයන් පහත දැක්වේ.

1. කෘෂිකර්මය

තේ, පොල්, අනෙකුත් කෘෂිකාර්මික භෝග, පලතුරු හා එළවළු ආදියෙහි එකතු කළ අගය ගණනය කිරීමේදී පරිභෝජනය හා වියදම පිළිබඳව තිබෙන අළුත්ම දත්ත භාවිතා කරන ලදී.

2. කෘෂි–සැකසුම්

එකතු කළ අගය ගණනය කිරීමේදී අළුත්ම වියදම් දත්ත භාවිතා කරන ලදී.

3. ධීවර කටයුතු

මාළු නිෂ්පාදනය පිළිබඳ නවතම දත්ත ඇතුළත් කරමින් ධීවර නිෂ්පාදනයේ එකතු කළ අගය සංශෝධනය කෙරිණ.

4. පතල් හා කැනීම් කටයුතු

විශේෂයෙන් මහවැලි වැනි විශාල ඉදි කිරීම් වැඩසටහන් හේතුවෙන් වැඩි දියුණු වූ කැනීම් කටයුතු හා ගොඩනැගිලි ද්‍රව්‍ය පාවිච්චි කිරීමේදී සිදු වූ වෙනස්කම්ද නිසා මෙම අංශය තුළ සිදු වූ ව්‍යූහාත්මක වෙනස්වීම් පිළිබිඹු වන අයුරින් පතල් හා කැනීම් කටයුතු අංශයේ එකතු කළ වටිනාකම ගණනය කිරීමේ පදනම සංශෝධනය කර ඇත.

5. විදුලි බලය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා

මෑතකාලීන වියදම් හා නිෂ්පාදන දත්ත උපයෝගී කර ගනිමින් මෙම අංශයේ එකතු කළ වටිනාකම ගණනය කිරීමේ පදනම සංශෝධනය කරන ලදී.

6. නිවාස අයිතිය

නිවාස අයිතිය පිළිබඳ අංශයේ එකතු කළ අගය ගණනය කිරීමේදී පාරිභෝගික මුදල් සමීක්ෂණයේ දත්ත මෙන්ම ජාතික ජන හා නිවාස සංගණනයේ දත්තද භාවිතා කරන ලදී.

7. රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂක කටයුතු

රාජ්‍ය පරිපාලන අංශයේ ඇති වූ වෙනස්කම් එහි එකතු කළ අගය ගණනය කිරීමේදී සැළකිල්ලට ගැනිණ.

සටහන (අ.1) හි ප්‍රතිශෝධිත ජාතික ආදායම් ඇස්තමේන්තු හා පැරණි ජාතික ආදායම් ඇස්තමේන්තු අතර සැසඳීමක් කර ඇත.

**අ. 1 සංඛ්‍යා සටහන**

**එකතුකළ වටිනාකමෙහි ප්‍රතිශෝධිත (1982) ඇස්තමේන්තු හා පැරණි (1970) ඇස්තමේන්තු අතර සැසඳීම**

(රු. දශලක්ෂ)

| අංශය | පැරණි ඇස්තමේන්තු | නව ඇස්තමේන්තු | වෙනස්වීම |
|---|---|---|---|
| 1. කෘෂිකර්මය .. .. .. | 20,544 | 20,771 | + 227 |
| 2. ධීවර කර්මාන්තය .. .. .. | 2,903 | 2,483 | − 420 |
| 3. කෘෂි ද්‍රව්‍ය සැකසුම් (අපනයන) .. .. | 3,379 | 2,846 | − 533 |
| 4. පතල් හා කැනීම් කටයුතු .. .. | 1,734 | 2,238 | + 504 |
| 5. විදුලිය, ගෑස් සහ සනීපාරක්ෂක සේවා .. | 1,244 | 1,089 | − 155 |
| 6. නිවාස අයිතිය .. .. .. | 2,052 | 3,250 | + 1,198 |
| 7. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු .. | 2,878 | 2,812 | − 66 |
| එකතුව | 34,734 | 35,489 | + 775 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව,